# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 37 වැනි කාණ්ඩය | ජූලි 2023

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගෙන යන වැඩපිළිවෙළ ජනපතිගේ ඇගයීමට



**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගෙන යන වැඩපිළිවෙළ මෙරට රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හේතු වී ඇති බවත් ඒ වෙනුවෙන් කැපවී කටයුතු කරන එහි සභාපති රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ඇතුළු සියලුදෙනාට තම කෘතඥතාව පිරිනමන බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය**

සන්නිවේදන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# අන්තර්ගතය

## පුවත්

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගෙන යන වැඩපිළිවෙළ ජනපතිගේ ඇගයීමට
- පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය ක්‍රීඩා සමාජය රාජ්‍ය සේවා කැරම් තරඟාවලියේ A හා C කාණ්ඩවල ශූරයන් බවට පත්වෙයි
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තැපැල් කටයුතු සඳහා නව සේවා කාණ්ඩයේ තැපැල් මුද්දරයක් නිකුත් කෙරේ
- මීගමුවේ සාන්ත පීතර විදුහලටත් පාර්ලිමේන්තු විදු පියසක්!
- පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රධානත්වයෙන්
- ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස නිරෝෂන් පෙරේරා මහතා පත් කෙරේ
- ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස වීරසුමන වීරසිංහ මහතා පත් කෙරේ
- මෙරට කාන්තා නායකත්වය දිරි ගැන්වීම සඳහා පාර්ලිමේන්තුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක්



## කාරකසභා පුවත්

- රට තුළ මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කෙරේ
- මෙරට අධ්‍යාපනය සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව කෝපා කමිටුවේ අවධානය
- ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ළමයින් සම්බන්ධව ඇති ගැටලු හඳුනාගෙන විසඳුම් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරන්න - කෝපා කමිටුවේ සභාපති පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදෙයි
- සතුන් මිලදී ගැනීමේදී නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීම අත්‍යවශ්‍යයි - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට කෝපා කමිටුවේදී අවධාරණය කෙරේ
- පොල් සංවර්ධන අධිකාරියේ, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහ පොල් පර්යේෂණ මණ්ඩලයේ පරිපාලන ගැටලු සහ අක්‍රමිකතා රැසක් කෝප් කමිටුවේදී අනාවරණය වෙයි
- ICTA ආයතනයේ අවිධිමත් පරිපාලනය ඇතුළු දුර්වලතා රැසක් පිළිබඳ කෝප් කමිටුවේ අවධානය
- කෝප් කමිටුවට මුදල් අමාත්‍යාංශයෙන් පැසසුම්

# අන්තර්ගතය

●රටේ මූල්‍ය බංකොලොත්භාවයට හේතු සොයා බැලීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ දායකත්වය ලබාගැනීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව තීරණය කරයි

●මෙරටට ආනයනය කරන ඖෂධවලින් 80% ආනයනය කරන්නේ ඉන්දියාවෙන් - සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි

●මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කොළඹ ක්‍රිෂ් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් පියවර ගන්න - අමාත්‍ය ප්‍රසන්න රණතුංග

●ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුවේ කෙටුම්පත ජාතික සභාවේ අනු කාරක සභාවට

●මුදල් අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් නොපැමිණීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අප්‍රසාදය

●වැවිලි සමාගම් කිහිපයක් EPF ගෙවීම පැහැර හැර ඇති බව විදේශ රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය වෙයි

●විදෙස් රටවල පිහිටා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කරන්න - ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව අදාළ අංශවලට දැනුම් දෙයි

●මෙරට පෞද්ගලික ආදායම් බදු ලිපිගොනු ලක්ෂ 05න් බදු ගෙවන්නේ 31,000ක් පමණයි - ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති මහින්දානන්ද අලුත්ගමගේ මහතා

●ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීම සඳහා නව යෙදුමක් වහාම සකස් කරන ලෙස ක්‍රම හා විධි කාරක සභාවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස්

●බදු එකතු කිරීමේ ක්‍රියාවලියේ ගැටලු සොයා බැලීමට පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක

පාර්ලිමේන්තු ජායා ගැලරිය

# කවරයේ කතාව

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගෙන යන වැඩපිළිවෙළ ජනපතිගේ ඇගයීමට



**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගෙන යන වැඩපිළිවෙළ මෙරට රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට හේතු වී ඇති බවත් ඒ වෙනුවෙන් කැපවී කටයුතු කරන එහි සභාපති රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතා ඇතුළු සියලු,දෙනාට තම කෘතඥතාව පිරිනමන බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.**

ගරු ජනාධිපතිවරයා මේ බව පැවසුවේ රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ වාර්තාවලට අනුව 2019 සහ 2020 වර්ෂවල ඉහළ කාර්යසාධන මට්ටමක් ළඟාකරගත් ආයතන 65ක් සඳහා රන් සහ රිදී සම්මාන පිරිනැමීමේ උත්සවයට සහභාගී වෙමිනි.

ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ හා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේදී මෙම උත්සවය මේ මස 18වැනිදා සිදු විය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපතිවරයා සඳහන් කළේ හරිත ආර්ථිකයක්, ඩිජිටල්කරණය සහ නව්‍යකරණය සමඟ ආර්ථිකය ඉදිරියට ගෙන යාම පැරණි ක්‍රමවේද අනුව සිදු කළ නොහැකි බවයි. එහිදී සියලු, රාජ්‍ය ආයතන එක අරමුණක් සහ එක් සැලැස්මක් ඔස්සේ එකම ඒකකයක් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවයද එතුමා අවධාරණය කළේය.

එසේම රාජ්‍ය වියදම් පාලනය, සෑම රුපියලකටම උපරිම වටිනාකමක් ලබාගැනීම, ආදායම් ඉහළ නංවා ගැනීම සහ රටේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කර ගැනීම යන මූල්‍ය වැඩපිළිවෙළ ඔස්සේ රට ඉදිරියට ගෙන යා යුතු බවත්,- ඒ සඳහා ශක්තිමත් පරිපාලන යාන්ත්‍රණයක් රටට අවශ්‍ය බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මෙහිදී සඳහන් කළේය.

තවද ශක්තිමත් ආර්ථිකයක් ඇති කර ගැනීම වෙනුවෙන් කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයට (RCEP) ඇතුළත්වීම මෙන්ම ඉන්දියාව සමග පවතින සබඳතා පුළුල් කර ගැනීමේ වැදගත්කමද ජනාධිපතිවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

එසේම මෙහිදී අදහස් දැක්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ලසන්ත අලගියවන්න මහතා ජයග්‍රහණ ලබාගත් සියලුම රාජ්‍ය ආයතනවලට සුබපැතුම් එක් කළ අතර 2015 වසරට වඩා අද වන විට රාජ්‍ය ආයතනවල සියයට 98කට වැඩි ප්‍රමාණයක විශාල ප්‍රගතියක් දක්නට ලැබෙන බවද පැවසීය.

මෙහිදී රාජ්‍ය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පොදු ගිණුම් තැබීමේ ක්‍රම, මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සකස්කර, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක කරනු ලබන පරිගණක ජාලගත ක්‍රමය මගින් වාර්ෂිකව ඇගයෙන අතර, ඒ අනුව විගණකාධිපතිවරයා විසින් විශ්ලේෂණය හා විමර්ශනය කොට, සිදු කළ ඇගයීම් අනුව ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කළ රාජ්‍ය ආයතන මෙලෙස සම්මානයට පාත්‍ර විය.



ඒ අනුව, රාජ්‍ය ආයතන 833 ක් ඇගයීමට ලක් වූ අතර, 2019 වර්ෂයේදී ඉන් තෝරාගත් ආයතන 15 ක් වෙත රන් සම්මාන සහ ආයතන 30ක් වෙත රිදී සම්මාන ද, 2020 වර්ෂයේදී තෝරාගත් ආයතන 15 ක් වෙත රන් සම්මාන සහ ආයතන 30ක් වෙත රිදී සම්මාන බැගින් සමස්ත සම්මාන 90 ක් පිරිනැමීම ගරු ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.




රජයේ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, රජයේ විශේෂිත වියදම් ඒකක, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා අරමුදල්, පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/විශේෂිත වියදම් ඒකක, පළාත් සභා ව්‍යවස්ථාපිත ආයතන, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන අංශ යටතේ මෙම සම්මාන පිරිනැමුණි.




අටවැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංකල්පයකට අනුව රජයේ ආයතනවල මූල්‍ය හා කාර්ය සාධනය ක්‍රමවත් කිරීමේ අරමුණින් රාජ්‍ය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇගයීමේ පරිගණක ජාලගත වැඩසටහන 2015 මුදල් වර්ෂය පදනම් කරගෙන 2016 වර්ෂයේදී ආරම්භ කළේය.

මෙම සම්මාන ප්‍රදානෝත්සවය සඳහා Zoom තාක්ෂණය ඔස්සේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා යටතේ පවතින ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු රාජ්‍ය ආයතන 1000 කට අධික ප්‍රමාණයක් සම්බන්ධ වීම සිදු විය.




මෙම අවස්ථාවට නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල, ජනාධිපති ලේකම් සමන් ඒකනායක, අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක, මුදල් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිරිවර්ධන, විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න, පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර ඇතුළු මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.



# පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය ක්‍රීඩා සමාජය රාජ්‍ය සේවා කැරම් තරඟාවලියේ A හා C කාණ්ඩවල ශූරයන් බවට පත්වෙයි



2023 රාජ්‍ය සේවා කැරම් තරඟාවලියේ A කාණ්ඩයේ සහ B කාණ්ඩයේ ශූරතාවය දිනා ගැනීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය ක්‍රීඩා සමාජය මේ මස සමත්විය.

A කාණ්ඩයේ අවසන් තරඟයේදී කොළඹ විශ්වවිද්‍යාලයීය කණ්ඩායම ද C කාණ්ඩයේ අවසන් තරඟයේදී මොරටුව විශ්ව විද්‍යාලීය කණ්ඩායම ද පරාජය කරමින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය ක්‍රීඩා සමාජය විසින් ශූරතාව දිනා ගන්නා ලදී.

මෙහිදී පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් A කාණ්ඩයේ තරඟ සඳහා සුජීව ලසන්ත (නායක), රසික රාජපක්ෂ, ගයාන් පෙරේරා, ප්‍රියන්ත ධර්මසේන සහ සංජය ප්‍රනාන්දු ද C කාණ්ඩයේ තරග සදහා තරිදු පෙරෝ (නායක), බවන්ත ශාමික, ප්‍රදීප් පුෂ්පකුමාර, ආර්.එම්. රත්නායක සහ චතුෂ්ක මධුසංක ද සහභාගී වූහ.

ශූරතාව දිනාගත් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය ක්‍රීඩා සමාජයට පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහලේකම් හංස අබේරත්න මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය විසින් සුබ පැතුම් එක් කිරීම ද සිදුවිය.





# පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තැපැල් කටයුතු සඳහා නව සේවා කාණ්ඩයේ තැපැල් මුද්දරයක් නිකුත් කෙරේ








ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තැපැල් කටයුතු සඳහා රුපියල් 5000 ක වටිනාකමින් යුත් නව සේවා කාණ්ඩයේ තැපැල් මුද්දරයක් නිකුත් කිරීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ පුස්තකාලයේදී මේ මස 06 වැනිදා සිදු විය.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය විසින් මෙම මුද්දරය නිකුත් කිරීම සිදු වූ අතර මේ මගින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විවිධ තැපැල් අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

මෙම අවස්ථාව සඳහා නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ,නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු අංගජන් රාමනාදන්, අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන, රාජ්‍ය අමාත්‍ය ගරු ශාන්ත බණ්ඩාර සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරු සහභාගී වූහ. එසේම පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර සහ පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් හංස අබේරත්න, තැපැල්පති එම්.ආර්.පී.සත්කුමාර යන මහත්ම මහත්මීහු ඇතුළු නිලධාරීහු පිරිසක් ද එක්ව සිටියහ.

# මීගමුවේ සාන්ත පීතර විදුහලටත් පාර්ලිමේන්තු විදු පියසක්!



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද, 'පාර්ලිමේන්තු විදු පියස' මහජන සේවා වැඩසටහන් මාලාවේ තවත් සුවිශේෂී වැඩසටහනක් මේ මස මීගමුව සාන්ත පීතර විදුහලේදී සාර්ථකව පැවැත්විණි

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, එහි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, න්‍යාය සහ සම්ප්‍රදාය ඇතුළු කරුණු පිළිබඳව තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන පැවැත්වුණේ අදාල පාසල විසින් පාර්ලිමේන්තුවෙන් කරන ලද විශේෂ ඉල්ලීමකට අනුවය.

මෙම පාර්ලිමේන්තු විදු පියස වැඩසටහන සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන අධ්‍යක්ෂ (වැඩබලන) ජනකාන්ත සිල්වා මහතා ඇතුළු පාර්ලිමේන්තුවේ නිලධාරීහු එදින සම්පත් දායකයන් ලෙස සම්බන්ධ වූහ.

මෙහිදී, අනාගත තරුණ පුරවැසියන් ලෙස පාසල් ප්‍රජාව පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් දැනුවත් විය යුතු තොරතුරු වඩාත් සරළව ඉදිරිපත් කෙරුණු අතර දරුවන් සහ ගුරුවරු සියලු, දෙනා අතිශය උද්යෝගයෙන් යුතුව මෙම වැඩසටහනට සම්බන්ධ වී සිටින අයුරු දැකිය හැකි විය.

සාන්ත පීතර විදුහලේ පැවති, පාර්ලිමේන්තු විදු පියස සුවිශේෂ මහජන සේවා වැඩසටහන නිමා වූයේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පැමිණි සියලු, ආරාධිත පාසල්වල නියෝජිතයන් වෙත ලබාදුන් සුවිශේෂ තිළිණ ප්‍රදානයක්ද සමඟිනි.





# පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය, ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රධානත්වයෙන්



පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය, ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශයේ සංවිධාන දායකත්වයෙන් පසුගියදා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්විණි.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක පාර්ලිමේන්තු ක්‍රමය හා සම්ප්‍රදාය පිළිබඳව මෙරට තරුණ ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කරමින් එම අත්දැකීම් ප්‍රායෝගිකව ළඟා කර දීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කෙරිණි.

මෙහිදී පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව මංගල සභාවාරයේදී අභිනව කතානායකවරයා තෝරාපත් කර ගන්නා ලදී මන්ත්‍රීවරයන් සහ අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දීමෙන් අනතුරුව, එක් එක් විෂය ක්ෂේත්‍රයන්ට අදාළව කරුණු දක්වමින් පාර්ලිමේන්තු විවාදයක්ද පැවැත්වීය.

අනතුරුව පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ හා සන්නිවේදන අධ්‍යක්ෂ (වැඩබලන) එච්.ඊ. ජනකාන්ත සිල්වා මහතා විසින් හරවත් දේශනයක් ඉදිරිපත් කළ අතර ශිෂ්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අමතා ඔවුන්ගේ දක්ෂතා පිළිබඳව අගය කිරීම ද මෙහිදී සිදුවිණ.

තවද මෙම අවස්ථාවට ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ සමාජවිද්‍යා සහකාර අධ්‍යක්ෂ වාසනා හෙට්ටිආරච්චි මහත්මිය, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ විදුහල්පතිනිය එම්.රූපසිංහ මහත්මිය, නියෝජ්‍ය විදුහල්පතිනිය කුකුලවිතාන මහත්මිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ පිරිසක් ද දෙමාපියන් ද සහභාගී වූහ.

වැඩසටහන අවසානයේදී පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පරිශීලනය සඳහා පාසල් පුස්තකාලයට පාර්ලිමේන්තු ක්‍රියාදාමය පිළිබඳව තොරතුරු ඇතුළත් වටිනා ග්‍රන්ථ ප්‍රදානයක්ද සිදු කරන ලදි.



# ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස නිරෝෂන් පෙරේරා මහතා පත් කෙරේ



ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිරෝෂන් පෙරේරා මහතා මේ මස 19 වැනිදා පත් කෙරිණි.

ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නවවැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ රැස්වීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි මෙම රැස්වීමට ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහකොමසාරිස් මයිකල් ඇපල්ටන් මහතා (Michael Appleton) ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස, අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිරිසක් සහ පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති, ගරු වේලු, කුමාර් සහ ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය යන මහත්වරුන් මිත්‍රත්ව සංගමයේ උප සභාපතිවරුන් ලෙස පත් විය. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තලතා අතුකෝරල මහත්මිය ලේකම් ලෙස පත් කරන ලද අතර, සහකාර ලේකම් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා සහ භාණ්ඩාගාරික ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉෂාක් රහුමාන් මහතා පත් කෙරිණි.

ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීම දෙරට ජනතාව සහ පාර්ලිමේන්තු අතර පවතින සුහද සබඳතාව වර්ධනය කිරීමට ඉවහල් වන බව මෙහිදී අදහස් දැක්වූ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේය.පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ පශ්චාත් උපාධි සඳහා නවසීලන්තය ශිෂ්‍යත්ව අවස්ථා ලබාදී ඇති බවත්, ශ්‍රී ලාංකිකයන් රැසක් ඉන් ප්‍රතිලාභ ලබා ඇති බවත් කථානායකවරයා මෙහිදී පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ශ්‍රී ලංකාවේ නවසීලන්තයේ ප්‍රථම නේවාසික මහ කොමසාරිස් මයිකල් ඇපල්ටන් මහතා නව පත්වීම් ලැබූ නිලධාරී මණ්ඩලයට සුබ පැතුම් එක් කළ අතර දෙරටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතර සුහදත්වය වර්ධනය සඳහා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ වැදගත්කම අවධාරණය කළේය.

රැස්වීමේදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා - නවසීලන්ත පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිරෝෂන් පෙරේරා මහතා, මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස තමන්ව තෝරා පත් කර ගැනීම පිළිබඳව සිය ස්තූතිය පළ කළ අතර, 2004 දී ඇති වූ සුනාමිය ඇතුළු තීරණාත්මක අවස්ථාවන්හිදී නවසීලන්ත රජය ලබා දුන් සහය වෙනුවෙන් සිය කෘතඥතාව පළ කළේය.







# ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස වීරසුමන වීරසිංහ මහතා පත් කෙරේ



ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මහතා මේ මස 05 වැනිදා පත් කෙරිණි.

ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නවවැනි පාර්ලිමේන්තුවට අදාළ නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීමේ රැස්වීම කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. මෙම රැස්වීමට ශ්‍රී ලංකාවේ වියට්නාම තානාපති හෝ ති තන් ට්‍රෑක් (H. E (Ms) Ho Thi Thanh Truc) මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර, නියෝජ්‍ය කථානායක ගරු අජිත් රාජපක්ෂ, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිරිසක් සහ පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු නාලක ගොඩහේවා, ගරු එම්. උදයකුමාර් සහ ගරු ගාමිණී වලේබොඩ යන මහත්වරුන් මිත්‍රත්ව සංගමයේ උප සභාපතිවරුන් ලෙස පත් විය. ගරු මොහොමඩ් මුසම්මිල් මහතා ලේකම්වරයා ලෙස පත් කරන ලද අතර, භාණ්ඩාගාරික ලෙස ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා පත් කෙරිණි.

ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර ඓතිහාසික සබඳතා බුදුදහම තුළින් ශක්තිමත් වූ බව සහ යටත් විජිත සමයේ පැවති වියට්නාම අරගලයේදී ශ්‍රී ලංකාව ලබාදුන් සහයෝගීතාවයෙන් ඒ බව මනාව පිළිබිඹු වන බවත් රැස්වීම අමතමින් කථානායකවරයා ප්‍රකාශ කළේය. පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිහිටුවීම තුළින් දෙරට අතර දිගුකාලීන සහයෝගීතාව තවදුරටත් වර්ධනය කිරීමට හේතු වන බවද කථානායකවරයා තවදුරටත් ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය යළි ස්ථාපනය කිරීම තුළින් දෙරට අතර පැවති සුහදතාවය සාම්ප්‍රදායික සබඳතා සහ බහුවිධ සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කර ගැනීමට කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ලබා දෙන ප්‍රබල සහය සහ මඟපෙන්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ වියට්නාම තානාපතිවරිය ගරු කථානායකතුමා වෙත සිය කෘතඥතාව පළ කළාය.



සහයෝගීතාවයේ සක්‍රීය පාලමක් ලෙස මිත්‍රත්ව සංගමය ක්‍රියා කරන බවත්, වෙළෙඳ, ආයෝජන, සංස්කෘතික හා සංචාරක වැනි ක්ෂේත්‍රවල දෙරට අතර සබඳතාවන් ප්‍රවර්ධනය කිරීමට මෙමගින් හැකිවනු ඇති බවට විශ්වාසය පළ කරන බවත් ඇය වැඩිදුරටත් පැවසුවාය.

එහිදී අදහස් දැක්වූ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා ප්‍රකාශ කළේ වියට්නාමය තාක්ෂණික දියුණුව, කාර්මික සංවර්ධනය සහ අපනයනය ඉලක්ක කරගත් ආර්ථිකයක් ප්‍රවර්ධනය කළ රටක් බැවින් වියට්නාමය සමග මිත්‍රත්ව සංගමය පිහිටුවීම තුළින් දෙරට අතර අදාළ ක්ෂේත්‍රයන්හි අන්‍යෝන්‍ය සබඳතාවන් ඇති කර ගැනීමට මූලික පදනමක් ලැබෙන බවයි.

රැස්වීමේදී අදහස් දැක්වූ ශ්‍රී ලංකා - වියට්නාම පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ අභිනව සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මහතා සංගමයේ සභාපතිවරයා ලෙස තමන්ව තෝරා පත් කර ගැනීම පිළිබඳව සිය කෘතඥතාව පළ කළේය.තවද වියට්නාමය සහ ශ්‍රී ලංකාව අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට සහ වර්ධනය කිරීමට කටයුතු කිරීමට තමන් අපේක්ෂා කරන බව ද ප්‍රකාශ කළේය.















# මෙරට කාන්තා නායකත්වය දිරි ගැන්වීම සඳහා පාර්ලිමේන්තුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක්

අනාගත ජාතික දේශපාලනයේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා මෙරට කාන්තාවන් බලගැන්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය විසින් සංවිධානය කළ විශේෂ මහජන සේවා වැඩසටහනක් පසුගිය දා සාර්ථකව පැවැත්විණි.

මෙම වැඩසටහනේ දී කාන්තාව දේශපාලනය තුළ මෙතෙක් පැමිණි ගමන් මඟ, ප්‍රාදේශිය දේශපාලනය හා පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, පාර්ලිමේන්තු මන්ත්‍රිවරියකගේ කාර්යභාරය, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ආදී තේමා පිළිබඳව මෙම වැඩසටහන මඟින් සහභාගි වූවන්ට මූලිකව අවබෝධයක් ලබා දීමට කටයුතු කෙරිණි.

ප්‍රාදේශිය දේශපාලනයේ නියැලෙන කාන්තා නායිකාවන්, සමාජ ක්‍රියාකාරිණියන් ප්‍රමුඛ කරගත් තරුණ ප්‍රජාව ඇතුළු විශාල පිරිසක් මෙම වැඩසටහනට සහභාගි වූ අතර, පාර්ලිමේන්තුවේ මන්ත්‍රිවරියන් සමඟ විවෘත සංවාදයක නිරත වීමටද, පාර්ලිමේන්තු සංචාරයක නියැලීමටද ඔවුනට අවකාශය සැලසිණි.







# කාරකසභා පුවත්



# රට තුළ මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කෙරේ



රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය සඳහා ගරු ටිරාන් අලස් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පහත සඳහන් මන්ත්‍රීවරයන් පත් කරන ලද බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙම මස 01 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

ඒ අනුව, ගරු නීතීඥ සිසිර ජයකොඩි, ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල, ගරු බුද්ධික පතිරණ, ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන, ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති, ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය, ගරු අසංක නවරත්න, ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ, ගරු තවරාජා කලෙයි අරසන්, ගරු මංජුලා දිසානායක යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් උක්ත කාරක සභාවේ සේවය කිරීම සඳහා පත් කොට තිබේ.



# මෙරට අධ්‍යාපනය සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳව කෝපා කමිටුවේ අවධානය



ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලු තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරුණි.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 07 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

පසුගිය ජුනි මස 20 දින කෝපා කමිටුවට අධ්‍යාපන අමාත්‍යාංශය කැඳවූ අවස්ථාවේදී මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ දත්ත පවත්වාගෙන යන අධ්‍යාපන කළමනාකරණ දත්ත පද්ධතිය (NEMIS) පිළිබඳ සාකච්ඡා වූ අතර මෙහිදී අනාවරණය වූයේ යාවත්කාලීන වූ ප්‍රමාණවත් දත්ත ප්‍රමාණයක් මෙම දත්ත පද්ධතිය සතු නොවන බවයි.මේ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතැම් ගැටලුවලට විසඳුම් සොයාගැනීම අපහසු වී ඇති බවත් එබැවින් මෙම දත්ත පද්ධතිය හා සම්බන්ධ වන සියලු පාර්ශවයන් සම්බන්ධ කර ගනිමින් මේ පිළිබඳ සාකච්ඡා කළ යුත් බවත් තීරණය විය.ඒ අනුව මෙදින (07) කෝපා කමිටුව රැස් වී මේ පිළිබඳව අවශ්‍ය සියලු පාර්ශ්වයන් සම්බන්ධ කර ගනිමින් දීර්ඝ ලෙස සාකච්ඡා කිරීම සිදු විය.

මෙහිදී කෝපා කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේ ගුරු හිඟයක් පවතින පාසැල් පිළිබඳ දත්ත, ගුරු අතිරික්තයක් පවතින පාසැල් පිළිබඳ දත්ත, ළමුන් පිළිබඳ දත්ත, ගුරු පුරප්පාඩු පිළිබඳ දත්ත ආදිය නිවැරදිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යා යුතු බවයි. මෙහිදී පළාත් කිහිපයකම අධ්‍යාපන පරිපාලන නිලධාරීන්ද සූම් තාක්ෂණය ඔස්සේද සම්බන්ධ කර ගැනීම සිදු විය. මේ අනුම මෙම සියලු, නිලධාරීන්ගෙන් දැනට පවත්නා දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීම පිළිබඳව සහ එහි පවතින අපහසුතාවන් පිළිබඳ විමසා බැලීම සිදු විය.

එසේම සබරගමුව පළාතේ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් සකස්කොට පළාත තුළ පවත්වාගෙන යන දත්ත පද්ධතියක් පිළිබඳවද එම නිලධාරීන් ගෙන්වා මෙහිදී පරීක්ෂාකරන ලදී මේ අනුව මෙම දත්ත පද්ධතියේ සාධනීය ලක්ෂන පවතින බව පෙන්වාදුන් කෝපා කමිටුව ජාතික වශයෙන් මෙම පද්ධතිය දියුණුකොට පවත්වාගෙන යාමේ හැකියාව පරීක්ෂාකොට බලා ඒ වෙනුවෙන් උපකාර කරන ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට උපදෙස් ලබාදීම ද සිදු විය.

මේ අනුව සතියක් තුළ ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ නිලධාරීන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් මුණගැසී සාකච්ඡාකොට පවතින දත්ත පද්ධතියේ අඩුපාඩු සකස්කරන ආකාරය පිළිබඳ වාර්තාවක් දෙන ලෙස කෝපා කමිටුවේ සභාපති රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා උපදෙස් ලබාදුන්නේය.






# ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ළමයින් සම්බන්ධව ඇති ගැටලු හඳුනාගෙන විසඳුම් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරන්න - කෝපා කමිටුවේ සභාපති පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදෙයි.

ප්‍රාදේශීය මට්ටමේ, දිස්ත්‍රික්ක මට්ටමේ, පළාත් මට්ටමේ සහ ජාතික මට්ටමේ පවතින ළමයින් සම්බන්ධ ගැටලු හඳුනාගෙන ඒ සඳහා විසඳුම් ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට උපදෙස් ලබාදුන්නේ ය.

රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා මෙම උපදෙස් ලබාදුන්නේ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2019/2020/2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඒ මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 04 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ලසන්ත අලගියවන්න මහතා පැවසුවේ පාසැල් නොපැමිණෙන ළමුන් පිළිබඳව ද හඳුනාගැනීමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම අවශ්‍ය වන බවයි. මේ නිසා කෙසේ හෝ මාසයකට වරක් හෝ මාස දෙකකට වරක් මෙම තොරතුරු පාසැල් මගින් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බව හෙතෙම පෙන්වා දුන්නේය. මේ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟද සම්බන්ධවී මේ පිළිබඳ වැඩපිළිවෙළක් සකස් කිරීම අවශ්‍ය වන බව ඒ මහතා පැවසීය. එසේම පාසැල් නොපැමිණෙන ළමයින් සම්බන්ධයෙන් ඉක්මනින් සොයා බලා කටයුතු කිරීම වැදගත් වන බව ද කෝපා කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය.



තවද රුපියල් 2,350,000 ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වෙත කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 2018 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය.මෙහිදී පැමිණ සිටි නිලධාරීන් මෙම දත්ත පද්ධතියේ ප්‍රායෝගික ගැටලු කිහිපයක් පවතින බව පැවසීය.මේ අනුව මෙම දත්ත පද්ධතිය ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන්නේය.

එසේම අණ පනත් යාවත්කාලීන කිරීම පිළිබඳවද කෝපා කමිටුව මෙහිදී පැමිණ සිටි නිලධාරීන්ගෙන් විමසීම සිදු වූ අතර මේ පිළිබඳව දින වකවානු සහිත වාර්තාවක් අගෝස්තු මස 08 දින වන විට ලබාදීමට කෝපා කමිටුව උපදෙස් ලබාදුන්නේ ය.






# සතුන් මිලදී ගැනීමේදී නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීම අත්‍යවශ්‍යයි - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට කෝපා කමිටුවේදී අවධාරණය කෙරේ



2018 සිට 2020 දක්වා කාලය තුළ විදේශීය පක්ෂීන් මිලදී ගැනීමේදී ඇතැම් පක්ෂීන් සඳහා ඇස්තමේන්තුගත මුදල රු.50,000 ක් පමණ වුවද මිලදී ගෙන ඇත්තේ රු.මිලියන කට පමණ බව පසුගිය දා පැවති රජයේ 15 කට ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය.මේ අනුව ඇස්තමේන්තු ගත මුදලට වඩා මිලදී ගෙන ඇති මුදල 3000%ක පමණ වැඩිවීමක් බවද මෙහිදී හෙළි විය.

මෙම ප්‍රසම්පාදනයේදී සැපයුම්කරු විසින් පක්ෂීන් වර්ග 32 ක්ම සැපයිය යුතුය යන කොන්දේසිය හේතුවෙන් වැඩි මිල ගණන් යටතේ පක්ෂීන් මිලදී ගැනීමට සිදුවීම නිසා රු.මිලියන 17කට ආසන්න අලාභයක් සිදුවීම පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය.

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ විගණකාධිපති වාර්තා සහ වත්මන් කාර්ය සාධනය පිළිබඳ විමර්ශනය සඳහා රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ ප්‍රධානත්වයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (කෝපා කමිටුව) මේ මස 05 වැනිදා දින රැස්වූ අවස්ථාවේදී මෙම කරුණු අනාවරණය විය.

මෙම මිලදී ගැනීමේදී ඇස්තමේන්තුගත වියදම සහ සැබෑ වියදම අතර මෙතරම් විශාල ප්‍රමාණයක වෙනසක් තිබීම ගැටලු සහගත බව කමිටුව අවධාරණය කරන ලදී. අදාළ විෂය සහ වෙළඳපොළ සම්බන්ධ අවබෝධය මෙම දෙපාර්තමේන්තුව සතු බැවින් තක්සේරු මුදල සහ සැබෑ වියදම අතර මෙතරම් ඉහළ අගයක් පැවතීම පිළිබඳව කමිටුව දීර්ඝ ලෙස ප්‍රශ්න කරන ලදී.එබැවින් මේ පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙසත් නිවැරදි තක්සේරුකරණයේ අවශ්‍යතාව අවධාරණය කරමින් ඉදිරියේදී අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසත් කෝපා සභාපතිවරයා අවධාරණය කළේය.

අලුතින් එක්වූ සත්වෝද්‍යාන ඇතුළු කරුණු පනතට කඩිනමින් ඇතුළත් විය යුතු බැවින් පනත කඩිනමින් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කරන ලදී.ඒ අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීමෙන් ඉදිරි මාසයක් ඇතුළත එම කටයුතු අවසන් කරන ලෙසත් මේ පිළිබඳ වාර්තාවක් 2023 අගෝස්තු 5ට පෙර ලබා දෙන ලෙසත් කෝපා සභාපතිවරයා උපදෙස් දුන්නේය.

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අදායම නිසි පරිදි වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාව මෙහිදී පෙන්වා දෙන ලදී. මේ අනුව ටිකට්පත්වලින් හා අනෙකුත් ක්‍රියාකාරකම්-වලින් ලැබෙන ආදායම් වෙන් වෙන්ව ඉදිරිපත්කරන ලෙස විගණකාධිපතිවරයා උපදෙස් දුන්නේය.

දැනට වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇති සතුන් සංරක්ෂණය සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොමැති බව නිරීක්ෂණය වන බැවින් වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කමිටුවක් පත්කර වැඩපිළිවෙලක් සකස් කරන ලෙසත් කමිටු සභාපතිවරයා දැනුම් දුන්නේය. IUCN රතු දත්ත පොතට අනුව දක්වා ඇති මෙරට දැනට වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සතුන් පිළිබඳ තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව ද පෙන්වා දෙන ලදී.ඒ අනුව මේ සම්බන්ධව පුළුල් ජාතික සමීක්ෂණයක් සිදු කළ යුතු බව අවධාරණය කෙරිණි.

මෙහිදී පින්නවල අලි අනාථාගාරය, පින්නවල වාගොල්ල සත්වෝද්‍යානය සහ රිදියගම සෆාරි උද්‍යානය යන ආයතනවල ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමුවිය. රිදියගම සෆාරි උද්‍යානයේ සිටින සතුන් 900ක් අතුරින් සතුන් 485 දෙනෙකුගේ ස්ත්‍රීපුරුෂ බව හෝ හඳුනාගෙන නොතිබීම පිළිබදව මෙහිදී විමසන ලදී.මෙම සතුන් අතුරින් 300 කට අධික පිරිසක් ඉන්දියාවෙන් ගෙනා තාරකා ඉබ්බන් බවත් නඩු කටයුත්තක් අවසන් වන තුරු සත්වෝද්‍යානය භාරයේ සිටින බවත් මෙහිදී අනාවරණය විය. එසේම මෙම සෆාරි උද්‍යානයේ එක් පශු වෛද්‍යවරයෙක් පමණක් සිටින බැවින් කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස කමිටු සභාපතිවරයා උපදෙස් දුන්නේය.

එසේම ආයතනය සතුව නිසි උපායමාර්ගික සැලැස්මක් නොමැති බැවින් 2024 - 2030 වර්ෂ සඳහා නව සැලැස්මක් පිළියෙල කර මෙම වසරේ දෙසැම්බර් 31 වන විට එහි කටයුතු අවසන් කරන ලෙස ද උපදෙස් දුන්නේය.

# පොල් සංවර්ධන අධිකාරියේ, පොල් වගා කිරීමේ මණ්ඩලයේ සහ පොල් පර්යේෂණ මණ්ඩලයේ පරිපාලන ගැටලු සහ අක්‍රමිකතා රැසක් කෝප් කමිටුවේදී අනාවරණය වෙයි





- පොල් වෙන්දේසියේ ඒකාධිකාරී මාෆියාව නතර කොට විනිවිද බව ඇති කිරීමට ඔන්ලයින් ක්‍රමවේදයක් හඳුන්වා දුන්න ද එය අක්‍රීයව පැවතීම පිළිබඳ දැඩි අප්‍රසාදය
- පොල් වගාවට වැළඳිය හැකි රෝග පාලනයට ආයතන ත්‍රිත්වයම සමඟ සාකච්ඡා කර පොදු වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට උපදෙස්
- පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් ඉඩම්වල වගාවන්ට අවසන් වරට පොහොර යෙදීම සිදුකර ඇත්තේ 2016 වසරේ බවත් හෙළි වෙයි
- මෙරට පොල්තෙල් පරිභෝජනයෙන් 78%ක් ආනයනික තෙල් මත සපුරා ගෙන තිබීම විශාල ගැටලුවක්
- ඩිජිටල් දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට පෞද්ගලික ආයතනයකට ගිවිසුමකින් තොරව රු.මිලියනක අන්තිකාරම් මුදලක් ගෙවලා
- සම්මුඛ පරීක්ෂණ සඳහා ක්‍රමවත් පරිදි  පෙනී නොසිටි පුද්ගලයන් 6 දෙනෙකු හිටපු සභාපතිවරයා විසින් හිතුමතේ සේවයට බඳවා ගැනීම පිළිබඳවත් වාර්තාවක් කැඳවයි

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 06 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මෙරට පොල් වගාව සහ කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන ආයතන ත්‍රිත්වය වන පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ පොල් පර්යේෂණ මණ්ඩලය යන ආයතන කැඳවා තිබිණි. 2021.01.21 දින පැවති කෝප් රැස්වීමේදී මෙම ආයතනවලට දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම මෙහිදී සිදුවිය.මෙහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු විය.

## පොල් වගාවට වැළඳිය හැකි රෝග පාලනයට ආයතන ත්‍රිත්වය සමග සාකච්ඡා කර පොදු වැඩපිළිවෙලක් සකස් කිරීම

හදිසි තත්ත්වයක් සේ සලකා විශේෂ කමිටුවක් පත් කර පොල් වගාවට වැළඳී ඇති සුදු මැස්සා රෝගය පාලනය කිරීමට සහ පොල් වගාවට වැළඳිය හැකි රෝග පාලනයට ආයතන ත්‍රිත්වය සමඟ සාකච්ඡා කර පොදු වැඩපිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාව සාකච්ඡා විය. මේ වන විට ස්ථාපිත කර ඇති 'ජාතික ආපදා කළමනාකරණ මෙහෙයුම් ඒකකය. සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධ වී නැති බැවින් මෙම මෙහෙයුම් කටයුතු සදහා එම ආයතනය ද සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාව මෙහිදී අවධාරණය කෙරිණි.

එසේම පොල් වගාවට නිසි කලට පොහොර නොයෙදීම නිසා මෙවැනි රෝග ඇතිවීමේ අවදානමක් පවතින බවත් නිලධාරීහු පැවසූහ.පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් ඉඩම්වල වගාවන්ට අවසන් වරට පොහොර යෙදීම සිදුකර ඇත්තේ 2016 වසරේ බවත් මෙහිදී අනාවරණය විය. රජයට අයත් පොල්වගාවන්ට හෝ කලට වෙලාවට පොහොර නොයෙදීම පිළිබඳ කමිටුවේ අප්‍රසාදය පළවිය.

ආයතන ත්‍රිත්වයම සම්බන්ධ කරගෙන සාකච්ඡා කොට ගනු ලබන ක්‍රියාමාර්ග සති දෙකක් තුළ දන්වන ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්වරයාට නිර්දේශ කර ඇත.ඒ අනුව මේ සම්බන්ධ අවශ්‍ය සම්පත් සැපයීම පිළිබදව පාර්ලිමේන්තුව, මහාභාණ්ඩාගාරය සහ ජනාධිපති ලේකම්වරයා දැනුවත් කිරීමට කටයුතු කරන බව කෝප් සභාපතිවරයා පැවසීය.

## පොල් වෙන්දේසියේ ඒකාධිකාරය නතර කොට විනිවිද බව ඇති කිරීමට ඔන්ලයින් ක්‍රමවේදය නැවත ක්‍රියාත්මක කිරීමට උපදෙස්

පොල් වෙන්දේසිය සඳහා අන්තර්ජාලයේ මාර්ගගත ක්‍රමය (ඔන්ලයින්) මගින් ලංසු තැබීමට පරිගණක මෘදුකාංගයක් සකස් කළද මේ වන විට එය අක්‍රිය තත්ත්වයේ පැවතීම පිළිබඳව අවධානය යොමු විය.වඩාත් විනිවිදබවකින් යුතුව වෙන්දේසිය සිදු කිරීමේ හැකියාව මෙමඟින් හැකියාව ලැබෙන බවත් පොල් වෙන්දේසියේ පවතින මෙරට පවතින කිහිපදෙනෙකුගේ ඒකාධිකාරිය වැළැක්වීමේ අරමුණින් මෙම ක්‍රමය හඳුන්වා දුන් බවද මෙහිදී හෙළි විය. තැරැව්කරුවන් කිහිපදෙනෙකුගේ අවශ්‍යතාව මත අධිකාරියේ ඇතැම් නිලධාරීන් හවුල්වීමෙන් මෙම ඔන්ලයින් ඩිජිටල් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අකමැත්ත පළ කරන බවද මෙහිදී සාකච්ඡා විය. මේ අනුව වඩාත් විනිවිද බවකින් යුතුව මෙම වෙන්දේසිය සිදු කිරීම සඳහා මෙම ඔන්ලයින් ක්‍රමවේදය නැවත ඇති කිරීමට මාස තුනක් ඇතුළත කටයුතු කරන ලෙස නියෝග කරන ලදී.

## දේශීය පොල් තෙල් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ප්‍රමිතියෙන් තොර ආනයනික පොල්තෙල් සීමා කිරීමේ අවශ්‍යතාව

මෙරට පරිභෝජනය සඳහා 2020-2022 කාලය තුළ පොල්තෙල් මෙට්‍රික් ටොන් 187,623ක් ආනයනය කර ඇති බවත් පාම් ඔයිල් මෙට්‍රික් ටොන් 225,510 ක් ආනයනය කර ඇති බවත් මෙහිදී අනාවරණය විය.මේ අනුව මෙරට පොල්තෙල් පරිභෝජනයෙන් 22%ක් දේශීය නිෂ්පාදනයෙන් ද 78%ක් ආනයනික තෙල් මත සපුරා ගෙන තිබීම විශාල ගැටලුවක් බවත් සාකච්ඡා විය.එසේම එම ආනයනික පොල්තෙල්වල ප්‍රමිතියේ පවතින ගැටලු පිළිබඳවද මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය.ඒ අනුව පොල් සංවර්ධන අධිකාරිය, පාරිභෝගික අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය ඇතුළු අදාළ ආයතන කැඳවා මේ පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදු කිරීමට මෙහිදී තීරණය විය.

## ඩිජිටල් දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට පෞද්ගලික ආයතනයකට ගිවිසුමක් තොරව රු.මිලියනක අත්තිකාරම් මුදලක් ගෙවීම

පොල් සංවර්ධන අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය ඉදිරියේ ඩිජිටල් එළිමහන් වෙළඳ දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට රු.මිලියන 5කට ආසන්න කොන්ත්‍රාත්තුවක් යටතේ පෞද්ගලික ආයතනයකට 2021 වසරේ ගිවිසුමක් තොරව පැවරීම සිදුකර තිබිණි. මින් අත්තිකාරම් මුදලක් ලෙස රු.මිලියනකට ආසන්න මුදලක් ලබා දී ඇති බවත් යම් බලපෑමක් මත ගෙවීම සිදුකළ බවත් මෙහිදී මූල්‍ය අධ්‍යක්ෂවරිය පැවසුවාය.මේ අනුව සති දෙකක් තුළ මේ පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු කර වගකියව යුත්තන් හෙළි කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට නියෝග කෙරිණි. මීට අමතරව විගණකාධිපතිවරයා විසින් වෙනම විමර්ශනයක් සිදුකිරීමට ද මෙහිදී තීරණය විය.

## සම්මුඛ පරීක්ෂණ සඳහා ක්‍රමවත් පරිදි පෙනී නොසිටි පුද්ගලයන් 6 දෙනෙකු හිටපු සභාපතිවරයා විසින් හිතුමතේ සේවයට බඳවා ගැනීම

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සම්මුඛ පරීක්ෂණ සඳහා ක්‍රමවත් පරිදි පෙනී නොසිටි පුද්ගලයන් 6 දෙනෙකු හිටපු සභාපතිවරයා විසින් හිතුමතේ සේවයට බඳවා ගෙන ඇති බවද මෙහිදී අනාවරණය විය.මේ පිළිබඳව දැඩි අප්‍රසාදය පළ කළ කමිටුව සති දෙකක් තුළ විධිමත් වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.එසේම මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ජනාධිපති ලේකම්වරයාට ද දන්වා සිටීමට ද තීරණය විය.





# ICTA ආයතනයේ ආයතනයේ අවිධිමත් පරිපාලනය ඇතුළු දුර්වලතා රැසක් පිළිබඳ කෝප් කමිටුවේ අවධානය

- ආරම්භයේදී අපේක්ෂිත අරමුණෙන් 25% වත් ඉටුකර ගැනීමට නොහැකිවූ බව සභාපතිවරයා පිළිගනී !!
- විසි වසරක් තුළ අත්හැර දැමූ ව්‍යාපෘතීන් පිළිබඳ විමර්ශනයක්
- වෙනත් ආයතනයකට වගකීම පවරන තෙක් කරගෙන ආ වැඩ කරගෙන යාමට කටයුතු කරන්න
- නිසි ප්‍රතිපත්තියකින් තොරව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කොට අතරමග නතර කිරීම නිසා පසුගිය කාලයේ අහිමි වූ මුදල රු.බිලියන 20 -30 ක් විය හැකි බව අමාත්‍යාංශ ලේකම් පවසයි
- තාක්ෂණික ආයතනයක් ලෙස යම් අධිකාරී බලයක් තිබිය යුතු වුවද රජයේ යම් නීතිමය රාමුවකට යටත් විය යුතු බව අවධාරණය කෙරේ

පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය ගරු රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 18 වැනිදා රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කොප් කමිටුව) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ආයතනය කැඳවා තිබිණි.

මෙහිදී ආයතනයේ 2018 සහ 2019 මූල්‍ය වර්ෂ සඳහා විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනයට අදාළ පහත සඳහන් මූලික කරුණු පිළිබඳව විමර්ශනය කිරීම සිදු විය.

## නිසි ප්‍රතිපත්තියකින් තොරව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කොට අතරමග නතර කිරීම නිසා රජයට විශාල මූල්‍ය පාඩුවක්

නිසි ප්‍රතිපත්තියකින් තොරව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කොට අතරමග නතර කිරීම නිසා රජයට විශාල මූල්‍ය පාඩුවක් සිදුව ඇති බව මෙහිදී අනාවරණය විය.එලෙස පසුගිය කාලයේ අහිමි වූ මුදල රු.බිලියන 20-30 ක් විය හැකි බව මෙහිදී තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙහිදී පැවසීය.

මෙය තාක්ෂණයට සම්බන්ධ ආයතනයක් ලෙස යම් අධිකාරී බලයක් තිබිය යුතු වුවද රජයේ අනෙකුත් නීතිරීති මගින් යම් පාලනයක් තිබිය යුතු බවත් එසේ නොවීම නිසා මෙවැනි තත්ත්වයන් ඇතිවී ඇති බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.රජයට අයත් සමාගමක් ලෙස සැලකිය හැකි වුවද ආදායම් උත්පාදනය නොකරන භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් වීම ගැටලුවක් බවත් ඒ මහතා පැවසීය.

## පසුගිය වසර විස්සක කාලය තුළ අතහැරදමා ඇති සියලු ව්‍යාපෘති, මූල්‍ය අලාභයන් සහ සම්බන්ධ වූ පුද්ගලයන් පිළිබඳ පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙසට නියෝග

ඉතිහාසය තුළ මෙම ආයතනය විවිධ අමාත්‍යාංශ යටතට පත්ව තිබීමත්, ආයතනය සතුව ස්ථාවර ප්‍රතිපත්තියක් නොමැතිවීම මෙන්ම ජාතික ප්‍රතිපත්තියක් නොමැතිවීමත් ප්‍රධාන ගැටලුවක් බවත් කමිටුව විසින් පෙන්වා දෙන ලදි.

ඉතිහාසය තුළ විවිධ රජයයන් යටතේ මෙම ආයතනයේ අධ්‍යක්ෂවරු ලෙස පත්වූ ඇතැමුන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේම විවිධ පෞද්ගලික සමාගම් හිමිකරුවන් සහ නියෝජිතයන් වීමද මෙම අක්‍රමිකතාවලට හේතුවී ඇතිබව සාකච්ඡා විය.

මෙම කටයුතු මූල්‍ය අපරාධ ගණයට වැටෙන බැවින් පසුගිය වසර විස්සක කාලයක් තුළ මෙම ආයතනය මගින් අතහැර දමා ඇති ව්‍යාපෘති මොනවාද ඒ සම්බන්ධ වියදම් සහ සම්බන්ධ වූ පුද්ගලන් ඇතුළු සියලු කරුණු පිළිබඳ යම් කමිටුවක් පත් කර පුළුල් සොයා බැලීමක් සිදුකර වාර්තාවක් මාස දෙකක් තුළ ලබා දෙන ලෙස කමිටු සභාපතිවරයා විසින් නිර්දේශ කරන ලදි.





## කැබිනට් තීරණයේ කොන්දේසිවලට පටහැනිව කොන්ත්‍රාත් සේවක පිරිසක් ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම

2020 වසරේදී කැබිනට් තීරණයේ කොන්දේසිවලට පටහැනිව බඳවා ගැනීමේ පටිපාටියක් සහ අනුමත සේවක සංඛ්‍යාවක් නොමැතිව කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ බහුතරයක් ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ද විමර්ශනය කෙරිණි.

සේවක මණ්ඩලය බඳවා ගැනීමේදී ආයතනය සතුව ස්වාධීන තීරණ ගැනීමේ බලය තිබුණද රාජ්‍ය භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් බැවින් කළමනාකරණාකරණ සේවා දෙපාර්තමේන්තුව හෝ වෙනයම් අයුරින් යම් රාමුවක් තුළ පාලනයකට යටත් කිරීමේ අවශ්‍යතාව කාරක සභාවේදී අවධාරණය කෙරිණි. එසේම බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) මේ වන නොමැති බැවින් මාස තුනක් තුළ ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දුන්නේය.

## ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එය අයවැයට සමගාමීව පිළියෙල කර නොතිබීම

2023 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එය අයවැයට සමගාමීව පිළියෙල කර නොතිබීම පිළිබඳ මෙහිදී අවධානය යොමු විය.මේ අනුව රජය විසින් අනුමත කර ඇති මුදලට පමණක් සැලැසුම් සකස් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී.

## අභ්‍යන්තර විගණනයේ ගැටලු

සමාගමේ අභ්‍යන්තර විගණනය නිසි පරිදි සිදු නොවීම පිළිබඳව ද සාකච්ඡා විය.අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතින බැවින් ඒ සඳහා කඩිනමින් මැදිහත්වන ලෙස දැනුම් දුන්නේය.

මේවන විට ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ඩිජිටල්කරණය පිළිබඳ පනතක් ගෙන ඒමට නියමිත බවත් ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තියක් සකස්කරමින් පවතින බවත් තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙහිදී පැවසීය.ඒ අනුව ICTA ආයතනය වෙනුවට වෙනත් ආයතනයක් පිහිටුවීමේ හැකියාව පිළිබඳව ඉදිරියේදී අවධානය යොමුකළ හැකි බවත් ලේකම්වරයා පෙන්වා දුන්නේය.

ආයතනයේ පරිපාලන කටයුතුවල විධිමත් බවක් නොමැති බැවින් වහාම නිවැරදි මාවතට ගැනීමේ අවශ්‍යතාව කෝප් සභාපතිවරයා විසින් අවධාරණය කරන ලදී.

නැවත ICTA ආයතන 2023 දෙසැම්බර් මස 7 වැනිදා කැඳවීමටත් මෙහිදී තීරණය විය.





# කෝප් කමිටුවට මුදල් අමාත්‍යාංශයෙන් පැසසුම්

## ආයතනයේ සිදුව ඇති ගනුදෙනු පිළිබඳ වෝහාරික විගණනයක් සිදුකිරීමට කමිටුවෙන් උපදෙස්
## මාස 06 කට පසු නැවත ප්‍රගති සමාලෝචනය කිරීමට තීරණය කෙරේ



කෝප් කමිටුව විසින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කලක් තිස්සේ පැවති අක්‍රමිකතා හෙළිදරව් කිරීම හේතුවෙන් අදාළ අක්‍රමිකතා මගහරවාගෙන ආයතනය දියුණු කිරීමට කටයුතු කිරීමට හැකිවි ඇති බැවින් ඒ පිළිබඳ කෝප් කමිටුවට සිය ස්තූතිය පල කරන බව පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්වරයා ප්‍රකාශ කළේය.

මේ අදහස් පළ වූයේ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව වෙත 2023 මාර්තු 07 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජිත් බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 04 වැනිදා පාරලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

කෝප් කමිටුවේ නියෝග මත ආයතනය විසින් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති වාර්තා සහ ලිපි ලේඛන සලකා බැලූ බවත් මේ වන විට ආයතනය ලබා ඇති ප්‍රගතිය පිළිබඳ සතුට පළ කරන බවත් කෝප් සභාපතිවරයා සඳහන් කළේය.




### කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විධිමත් කිරීම

මෙහිදී මහා භාණ්ඩාගරයේ නියෝජ්‍ය ලේකම්වරයා ප්‍රකාශ කර සිටියේ කෝප් කමිටුව විසින් ලබා දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවර ලෙන ඇති බව සහ ඒ අනුව ආයතනයේ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය බඳවා ගැනීමේ පටිපාටි කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කොට මේ වන විට දැන්වීම් පල කොට තිබේ.

### වාර්ෂික වාර්තා සහ සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කිරීම

එමෙන්ම ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමද කඩිනම් කිරීමට කටයුතු කරන බවද මෙහිදී නිලධාරීහු පෙන්වා දුන්හ.ආයතනයේ සංයුක්ත සැලැස්ම මේ වන විටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමතියට යටත්ව එය ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති බවත් මෙහිදී අවධාරණය විය.

## සංයුක්ත සැලැස්මේ ව්‍යාපාරික අරමුණු

දැනට ඉදිරිපත් කර ඇති සංයුක්ත සැලැස්මේ අඩංගු ව්‍යාපාරික අමුණු සාක්ෂාත් කිරීමේ උපායමාර්ග පිළිබඳ කෝප් සභාපතිවරයා මෙහිදී විමසා සිටියේය.එහිදී නිලධාරීන් සඳහන් කළේ ආයතනයේ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික සැලැස්මක් මේ වන විට සකස් කොට ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවයි.

## අක්‍රමිකතා පිළිබඳ මූලික විමර්ශන

කමිටුවේ නිර්දේශ අනුව ආයතනයේ සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කොට අතුරු වාර්තාවක් කෝප් කමිටුව වෙත ඉදිරිපත් කොට ඇති බවද මෙහිදී ප්‍රකාශ විය.එයට අමතරව ආයතනයේ අක්‍රමිකතා රැසකට වගකිවයුතු යැයි සැලකෙන සාමාන්‍යාධිකාරීවරයා මේ වන විට අනිවාර්ය නිවාඩු යවා ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතින බවද පැමිණ සිටි නිලධාරීහු පෙන්වා දුන්හ.

මෙහිදී පරීක්ෂණ වාර්තාව පිළිබඳ අදහස් දැක්වූ නිලධාරීන් පෙන්වා දුන්නේ 2006 සිට කටයුතු කළ උක්ත සාමාන්‍යාධිකාරීවරයාගේ ක්‍රියාකලාපය හේතුවෙන් පරිපාලන ගැටලු රාශියක් මතුව ඇති බවයි. එයට අමතරව අක්‍රමවත් බඳවා ගැනීම්, ප්‍රතිරක්ෂණය ක්‍රියාත්මක නොකිරීම, නිලධාරීන්ට රාජකාරී ලැයිස්තු ලබා නොදීම, නිලධාරීන්ට අසමාන අයුරින් සැලකීම, ආයතනයේ සුභසාධනය කපා හැරීම, ආයතනයේ කාර්ය සාධනය දිගින් දිගටම අඩුවීම ඇතුළු අනෙකුත් අක්‍රමිකතා රැසක් වාර්තාව මගින් අනාවරණය වූ බවයි.

මෙහිදී කෝප් කමිටු සාමාජිකත්වය උපදෙස් ලබා දුන්නේ සිදුකර ඇති විමර්ශනය ප්‍රමානවත් නොවන බැවින් ආයතනයේ සිදුවී ඇති ගනුදෙනු සම්බන්ධව වෝහාරික විගණනයක් හෝ එවැනි ගැඹුරු විමර්ශනයක් පවත්වන ලෙසයි.මාස 06කට පසු ආයතනයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව නැවත කැඳවන බවද සභාපතිවරයා දැනුම් දුන්නේය.








# රටේ මූල්‍ය බංකොලොත්භාවයට හේතු සොයා බැලීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ දායකත්වය ලබාගැනීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව තීරණය කරයි



රටේ මූල්‍ය බංකොලොත්භාවයට හේතු සොයා බැලීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ දායකත්වය ලබාගැනීමට, රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව තීරණය කළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රී (නීතිඥ) සාගර කාරියවසම් මහතාගේ සභාපතීත්වයෙන් මෙම විශේෂ කාරක සභාව පළමුවරට මේ මස 18 වැනිදා පාර්ලිමේන්තුවේ රැස්වූ අවස්ථාවේදී කාරක සභාවේ ඉදිරිවැඩකටයුතු පිළිබඳ මූලික කරුණු සාකච්ඡා කිරීම සිදුවිය.

ඒ අනුව අදාළ ප්‍රවීණයන් කවුරුන්ද යන්න යෝජනා කරන ලෙස ද කාරක සභාවේ සභාපතිවරයා සාමාජික මන්ත්‍රීවරයන්ට දැනුම් දුන්නේය.

මේ අතර, විපක්ෂය ගෙන ආ යෝජනාවක් අනුව පත්කළ මෙම කාරක සභාවේ සභාපතිවරයා විපක්ෂයේ නියෝජනයක් විය යුතු බවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉල්ලා අස්වී ඇති බැවින් මේ පිළිබඳව කථානායකවරයාගේ විශේෂ අවධානයට යොමු කළ යුතු බවත් මෙම රැස්වීමට සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශානක්කියන් රාසමාණික්කම් මහතා සඳහන් කළේය.

ඒ අනුව, රට බංකොලොත්භාවයට ලක්වන විට රට පාලනය කිරීමේ වගකීම දැරූ ප්‍රධාන පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම්වරයා මෙම කාරක සභාවේ  සභාපතිවරයා ලෙස කටයුතු කිරීම කමිටුවේ ස්වාධීනත්වයට බාධාවක් බැවින් කාරක සභාවෙන් ඉල්ලා අස්වන බවත් රාසමාණික්කම් මහතා සඳහන් කළේය.

මෙහිදී අදහස් දැක්වූ කාරක සභාවේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී (නීතිඥ) සාගර කාරියවසම් මහතා ප්‍රකාශ කළේ මෙම කාරක සභාව දේශපාලන කාරක සභාවක් නොවන බවත්, යෝජනාව ගෙනෙන පක්ෂයෙන්ම සභාපතිවරයා පත්විය යුතු බවට සම්මතයක් නොමැති බවත්ය.

එසේම, පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පත්කිරීමේ දී, සම්ප්‍රදායට අනුව කාරක සභාවේ ව්‍යුහයට අනුව ආණ්ඩු පාර්ශවයට වැඩිම නියෝජනයක් සහ විරුද්ධ පාර්ශවයට අඩු නියෝජයනයක් ලබා දෙන බව ඔහු පෙන්වා දුන්නේය. එසේම කාරක සභාවේ ස්වාධීනත්වය පවතින්නේ කාරක සභාවේ සාමාජිකයන් මත නොව කමිටුව ක්‍රියාකරන ආකාරය මත බවද ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය.







# මෙරටට ආනයනය කරන ඖෂධවලින් 80% ආනයනය කරන්නේ ඉන්දියාවෙන් - සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පවසයි

**බාල ඖෂධ යනු කුමක්දැයි අර්ථකථනයක් නැති බැවින් බාල ඖෂධ යන්න ප්‍රතික්ෂේප කරනවා - අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල**

**ඖෂධ නොගෙනාවේ නම් මිනිසුන් මිය යන්නේ බෙහෙත් නොමැතිකමින් - අමාත්‍යාංශ නිලධාරීන්**

**පේරාදෙණිය සිදුවීමට අදාළ ඖෂධ 167,000 ක් මෙම වර්ෂය තුළ භාවිතා කොට තිබෙනවා - අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල**



ඉන්දියානු ණය ආධාරය නොමැති කාලසීමාවේදීත් මෙරටට ආනයනය කරන ඖෂධවලින් 80% ආනයනය කරන්නේ ඉන්දියාවෙන් බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පැවසීය.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් මේ බව සඳහන් කළේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 19 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සංජීව එදිරිමාන්න මහතා මේ සම්බන්ධයෙන් විමසූ අවස්ථාවේදී නිලධාරීන් මේ සම්බන්ධයෙන් පැවසූ අතර මෑත කාලීනව ඉන්දියානු ණය අධාර යටතේ ගෙන්වූ බෙහෙත් භාවිතා කරන බවද ඔවුහු පෙන්වා දුන්හ. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් එම නිලධාරීන් පෙන්වා දුන්නේ ඖෂධ ගෙන්වීමට අවශ්‍ය අංශ කටයුතු නොකළේ නම් මිනිසුන් මිය යන්නේ ඖෂධ නොමැති කමින් බවයි.

එසේම මෙහිදී අදහස් දක්වමින් අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා පෙන්වා දුන්නේ පේරාදෙණිය රෝහලේ සිදු වීම සිදු වන අවස්ථාවේදී එම වාට්ටුවේම සිටි රෝගීන් 12 දෙනෙකුට මෙම ඖෂධය ලබාදී තිබූ බවයි.තවද මෙම වසර තුළ 167,000 ක් මෙම ඖෂධය භාවිත කොට ඇති බවයි. එසේම 230,000ක් රෝහල් සඳහා මෙම ඖෂධය ලබා දී ඇති බවයි.මෙම ඖෂධය 2013 ඔක්තෝම්බර් 21 ලියාපදිංචි කොට ඇති ඖෂධයක් බවද අමාත්‍යවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

එසේම බාල ඖෂධ යනු කුමක්දැයි අර්ථකථනයක් නැති බැවින් බාල ඖෂධ යන්න තමන් ප්‍රතික්ෂේප කරන බවද අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා මෙහිදී සඳහන් කළේය.

මෙහිදී මහාචාර්ය සේනක බිබිලේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය වර්තමානයේ ක්‍රියාත්මක වන්නේදැයි පාර්ලිමේන්තු මන්ත්‍රී (මහාචාර්ය) ගරු තිස්ස විතාරණ මහතා විමසා සිටි අතර එම ප්‍රතිපත්තිය තවමත් අනුගමනය කරන බවද අමාත්‍ය රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය.මෙහිදී මෙම ප්‍රතිපත්තිය මගින් සම්පූර්ණ වසරකට අවශ්‍ය ඖෂධයන් ඖෂධ නාමය සහිතව එක් වර ටෙන්ඩර් කොට ලබාගැනීම පිළිබඳ අදහස් කොට ඇති බව මහාචාර්ය තිස්ස විතාරණ මහතා පෙන්වා දුන්නේය.

මීට අමතරව දිස්ත්‍රික්ක මට්ටමෙන් රෝහල් ආශ්‍රිතව පවතින ගැටලු නිලධාරීන් සම්බන්ධ පුරප්පාඩු, ඖෂධ සහ උපකරණ හිඟය පිළිබඳවද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා විය.





# මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කොළඹ ක්‍රිෂ් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් පියවර ගන්න - අමාත්‍ය ප්‍රසන්න රණතුංග



මේ වන විට ඉදිකිරීම් කටයුතු අතහැර දමා ඇති කොළඹ ක්‍රිෂ් ගොඩනැගිල්ල සහ අවට වැඩබිම් ප්‍රදේශය ආශ්‍රිතව මහජනතාවට අනතුරක් සිදුවීමේ වැඩි ඉඩකඩක් පවතින බැවින් අවශ්‍ය ආරක්ෂිත පියවර කඩිනමින් ගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මහතා අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන්නේය.

යම් ආකාරයකින් අනතුරක් සිදුවුවහොත් මෙහි වගකීම අමාත්‍යාංශය ඇතුළු රජයට පැවරෙන බැවින් මේ සම්බන්ධයෙන් වහාම පියවර ගැනීමේ අවශ්‍යතාව අමාත්‍යවරයා අවධාරණය කළේය.

නාගරික සංවර්ධන හා නිවාස අමතයාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මහතාගේ සභාපතීත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී අමාත්‍යවරයා විසින් මෙම උපදෙස් ලබා දෙන ලදී. රාජ්‍ය අමාත්‍යවරුන් වන ගරු තේනුක විදානග මගේ සහ ගරු අරුන්දික ප්‍රනාන්දු යන මහත්වරු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

ක්‍රිෂ් ගොඩනැගිල්ල ඉදිකරමින් පැවති ස්ථානයේ සවිකර ඇති ඉදිකිරීම් ආධාරක ඇතුළු උපාංග සුළඟට කඩා වැටී අනතුරු සිදුවීමේ අවදානමක් පවතින බවත්, ජලය එක්රැස්වීම හේතුවෙන් මදුරුවන් බෝවීමේ හැකියාව පවතින බවත් මෙහිදී සාකච්ඡා විය.විශේෂයෙන් මෙම ගොඩනැගිල්ලේ මහල් ත්‍රිත්වයක් පොළොව මට්ටමට පහළින් පැවතීම නිසා එහි වැසි ජලය එක්රැස්ව ඩෙංගු ව්‍යාප්ත වීමේ දැඩි අවධානමක් මතුව ඇති බැවින් අවට ප්‍රධාන පෙළේ සංචාරක හෝටල්වලින් පැමිණිලි ලැබී ඇති බවද නිලධාරීහු මෙහිදී අනාවරණය කළහ.

ඒ අනුව මෙම ආයෝජකයා සමඟ සාකච්ඡා කර ඉදිකිරීම් කටයුතු නිශ්චිත කාලරාමුවක් තුළ නැවත ආරම්භ කිරීමට අපොහොසත් වුවහොත් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට අමාත්‍යවරයා වැඩිදුරටත් උපදෙස් ලබා දුන්නේය.

ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් අදාළ ආයෝජන සමාගම සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත් නිලධාරීහු මෙහිදී පැවසූහ.

මීට අමතරව, පළාත් පාලන ආයතනවල මැදිහත්වීමකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියේ අවසරයෙන් පමණක් ගම්පහ සංඝබෝධි විද්‍යාලය ඉදිරිපිට ඉදිකරන ලද නිවාස ව්‍යාපෘතිය මේ වන විට අතරමග අත්හැර දමා ඇති බව කමිටුවේ අවධානයට යොමු විය.මෙම නිවෙස්වලට මාර්ග, ජලය සැපයීම, අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු යටිතල පහසුකම් ද නිසි පරිදි ලබාදී නොමැති බවත් මෙහිදී හෙළි විය.

විශේෂ ව්‍යාපෘතියක් ලෙස අවසර ලබාදී ඇති මෙම ව්‍යාපෘතිය නියමිත ප්‍රමිතීන්ට අනුව සිදුනොකිරීම නිසා නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බව නිලධාරීහු පෙන්වා දුන්හ.පසුගිය මාර්තු මාසයේ පැවති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සාකච්ඡා කළ ද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම පිළිබඳව අමාත්‍යවරයා සිය අප්‍රසාදය පළ කළේය. ඒ අනුව, මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගෙන සති දෙකක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ලබාදෙන ලෙස අමාත්‍යවරයා නියෝග කළේය.



# ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුවේ කෙටුම්පත ජාතික සභාවේ අනු කාරක සභාවට



ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුවේ කෙටුම්පත කෙටි, මධ්‍යම හා දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභාවේ අනු කාරක සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් කෙටි, මධ්‍යම හා දිගුකාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභාවේ අනු කාරක සභාව මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදී මෙසේ මෙම සංකල්පීය ප්‍රතිපත්ති රාමුව ඉදිරිපත් කිරීම සිදු කෙරිණි.

ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම, සත්ත්ව පාලනය සහ ධීවර කටයුතු) සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාකාරී කමිටුවක් පත් කොට තිබුණු අතර මෙම ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා එම ක්‍රියාකාරී කමිටුව මාස අටක පමණ කාලයක් රැස්විය. වාරිමාර්ග අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, වැවිලි අමාත්‍යාංශය, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය, වන හා සංරක්ෂණ අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සහ වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, ඇතුළු විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන් මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ආහාර හා කෘෂිකර්ම සංවිධානය,නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව එක්ව මෙම සංකල්පීය ප්‍රතිපත්තිය සකස් කර ඇත.

රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මධ්‍ය කාලීන සහ දිගුකාලීන අදහස් රාශියක් එහි අඩංගු වේ. මේ අනුව ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සංකල්පීය ප්‍රතිපත්ති රාමුව ජාතික සභාවටත් ඒ හරහා පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කරන බව කෙටි, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනයේ ප්‍රමුඛතා හඳුනාගැනීමේ ජාතික සභා අනු කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා පැවසීය.

එසේම ඉන්පසු, ආයතන ප්‍රතිපාදන වෙන් කරගැනීම සඳහා අදාළ අමාත්‍යංශ දැනුවත් කිරීම හා අවශ්‍ය නීතිමය සංශෝධන සම්බන්ධයෙන් ද ඉදිරියේ දී කටයුතු කරන බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.







# මුදල් අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන් නොපැමිණීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අප්‍රසාදය

**නිලධාරීන්ගේ පිළිතුරු පිළිබද සෑහීමකට පත්විය නොහැකි බව කමිටුව පෙන්වා දෙයි**

**ජනාධිපතිවරයාගේ ආර්ථික දැක්මට අනුකූලව 2048 වර්ෂය වන විට ළඟා කර ගැනීමට සැලසුම්කරන අමාත්‍යාංශයේ තිරසාර සැලැස්ම පිළිබඳවත් ප්‍රශ්න කරයි**



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 25 වැනිදා වැනිදා පැවති රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවා තිබූ මුදල් අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරීන් නොපැමිණීම සම්බන්ධයෙන් එම කමිටුවේ අප්‍රසාදය පළවිය.මුදල් අමාත්‍යාංශයට අදාළ කරුණු සාකච්ඡාවට ගැනීම සඳහා නිලධාරීන් කැඳවන විට පාර්ලිමේන්තුවට වගකියන අමාත්‍යාංශ ප්‍රධානීන් කාරක සභාව හමුවේ පෙනී සිටිය යුතු බව මෙහිදී අවධාරණය කෙරිණි.

මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 10 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2023 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව සලකා බැලීම සඳහා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව රැස්වූ අවස්ථාවේ මෙම කරුණු සාකච්ඡා විය.

මුදල් අමාත්‍යාංශය විසින් 2023 ජූනි මස අවසන් වන විට මූල්‍ය තත්ත්වය මෙහිදී ඉදිරිපත් කරන ලදී මෙම වාර්තාවට අනුව, අයවැයේ ප්‍රාථමික ශේෂය 0.1% ක අතිරික්තයක් විය.ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා මත වැට් බද්ද සැලකිය යුතු ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ආදායම් එකතු කිරීම වාර්ෂිකව 41.9% කින් බිලියන 1.317 දක්වා ඉහළ ගොස් ඇත. පළමු අර්ධය සඳහා වියදම බිලියන 2.560 ක් වූ අතර එය 40.5% ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ.විශාලතම වැඩිවීම වී ඇත්තේ දේශීය පොලී වියදම වන අතර එය මේ වසරේ පළමු භාගයේ දී බිලියන 1.273 දක්වා 51.6% කින් ඉහළ ගොස් ඇත.

පැමිණ සිටි නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යාලේඛන මත පදනම්ව රාජ්‍ය මූල්‍ය තත්ත්වය,ආර්ථික කාර්ය සාධනය ආදී කරුණු පිළිබඳව කමිටු සාමාජිකයෝ විවිධ ප්‍රශ්න මතු කළහ. විශේෂයෙන් 2023 පළමු කාර්තුවේ සියයට 11.5 ක ආර්ථික සංකෝචනය සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමුවිය.එවැනි තත්ත්වයන් සඳහා බලපෑ හේතු සහ තවදුරටත් ආර්ථික පසුබෑම වැළැක්වීම සඳහා ගෙන ඇති නිශ්චිත ක්‍රියාමාර්ග පිළිබඳව මෙහිදී කමිටුව විසින් ප්‍රශ්න කරන ලදී.

එසේම ජනාධිපතිවරයාගේ ආර්ථික දැක්මට අනුකූලව 2048 වර්ෂය වන විට ළඟා කර ගැනීම සැලසුම්කරණ- අමාත්‍යාංශයේ තිරසාර සැලැස්ම පිළිබඳවද කමිටුව විසින් වැඩිදුරටත් ප්‍රශ්න කරන ලදී. නමුත් සංවර්ධිත රටකට ළඟාවීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැතියද අමාත්‍යාංශය සතුව ඒ වෙනුවෙන් නිවැරදි උපායමාර්ගික සැලැස්මක් නොමැති බව මෙහිදී හෙළි විය.

ප්‍රමාණවත් දත්ත සහ සංඛ්‍යාලේඛන සමග සූදානමකින් යුතුව කාරක සභාව හමුවේ පෙනී සිටීමේ අවශ්‍යතාව අවධාරණය කළ කමිටුව, තිරසාර ආර්ථික ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා නිලධාරීන් වඩාත් වගකීමෙන් සහ නිසි දැක්මක් සහිතව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නේය.



# වැව්ලි සමාගම් කිහිපයක් EPF ගෙවීම පැහැර හැර ඇති බව විදේශ රැකියා සහ ශ්‍රමය පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය වෙයි



වතු ක්ෂේත්‍රයේ වැව්ලි සමාගම් කිහිපයක් EPF ගෙවීම පැහැර හැර ඇති බවත් හිඟ මුදල් විශාල ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවීමට ඇති බවත් විදේශ රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී අනාවරණය විය.

වතු ක්ෂේත්‍රයේ සමාගම් විසින් ගෙවන ලද මුදල් රුපියල් මිලියන 700ක පමණ ප්‍රමාණයක් පිළිබඳ ලබාදී ඇති තොරතුරුවල පරස්පරතා හේතුවෙන් ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇති බවත් කාරක සභාව හමුවේ හෙළි විය.



මෙම කරුණු සාකච්ඡා වුයේ විදේශ රැකියා සහ ශ්‍රමය පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව ගරු එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හෙක්ටර් අප්පුහාමි මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා රැස් වූ අවස්ථාවේදීය.

සේවකයන්ව ආරක්ෂා කරමින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවීමට ඇති හිඟ මුදල් සහ වර්තමාන මාසික ගෙවීම් කටයුතු ක්‍රමානුකූලව සිදු කරගෙන යාමට කටයුතු කරන ලෙස කාරක සභාවේ සභාපති ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් වැව්ලි සමාගම් නියෝජිතයන්ට උපදෙස් දෙන ලදී.

එමෙන්ම ජාතික හැඳුනුම්පත් අංකයට අනුව ගිණුම් ආරම්භ කිරීම මගින් එකම පුද්ගලයෙකුට ගිණුම් කිහිපයක් තිබීමේ ගැටළු මගහරවා ගැනීමට හැකි බවත් ඒ සඳහා අවධානය යොමු කර ක්‍රියා කරන ලෙසත් කාරක සභාව නිලධාරීන්වෙත උපදෙස් දුන්නේය.







# විදෙස් රටවල පිහිටා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කරන්න - ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව අදාළ අංශවලට දැනුම් දෙයි

විදෙස් රටවල පිහිටා ඇති ශ්‍රී ලංකා තානාපති/ මහකොමසාරිස් කාර්යාල හරහා සංචාරක ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලෙස ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට පසුගියදා දැනුම් දෙන ලදී.ඒ සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහයෝගය අදාල පාර්ශ්ව වෙත ලබා දෙන ලෙසත් කාරක සභාව විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී.

ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ගරු නාමල් රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් මේ මස රැස්වූ අවස්ථාවේදී මේ පිළිබව සාකච්ඡා විය.

ඉහළ ආදායම් ලබන රටවලින් සංචාරකයන් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීමත්,ඒ තුළින් සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබිය හැකි ආදායම් ඉහළ නංවා ගැනීමේ වැදගත්කම පිළිබඳවත් මෙහිදී සාකච්ඡා වූ අතර ඒ සඳහා අවශ්‍ය පියවර නොපමාව ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දීම සිදුවිය.
ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් විවෘත කිරීම තුළ විශාල වාසියක් ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට අත්පත් කර ගැනීමේ හැකියාවක් ඇති බැව් ගරු යදාමිණී ගුණවර්ධන මහතා මෙහිදී පෙන්වා දුන් අතර ඒ පිළිබඳව වාර්තාවක් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් රුමේනියාවේ දී විවෘත කිරීමට අදාළ කටයුතු කඩිනම් කරන ලෙසත් කාරක සභාව විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත සිය නිර්දේශ ලබා දෙන ලදී ශ්‍රී ලංකාව හා රුමේනියාව අතර සබඳතා පුළුල් කිරීම හා රුමේනියාවේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සපුරාලීම මෙහි අරමුණ වී තිබේ.

තවද,මෙම කාරක සභාවේදී මීට පෙර ලබාදුන් නිර්දේශය අනුව විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට නව විදේශ ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමේදී සහ විදේශ ගමන් බලපත්‍රය අලුත් කිරීමේදී ජූනි මස 01 වැනිදා සිට අන්තර්ජාලය ඔස්සේ අයදුම් කළ හැකි පරිදි අවශ්‍ය කටයුතු සිදු කිරීම පිළිබඳ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් අදාල බලධාරීන් වෙත කාරක සභාව සිය ස්තූතිය පිරිනමන ලදී.

ශ්‍රී ලංකාවේ සංචාරයේ යෙදෙන රුසියානු සංචාරකයන් හට ශ්‍රී ලංකාවේ දී සිය ගෙවීම් කිරීම පහසු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව කාරක සභාවේ දී සාකච්ඡා කරන ලදී. එහිදී,රුසියානු සංචාරකයන් සඳහා දැනට මහජන බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදය හා UnionPay ක්‍රමවේදය පිළිබදව කාරක සභාව අදාල බලධාරීන්ගෙන් විමසූ අතර යථෝක්ත සංචාරකයන් සඳහා මෙම ක්‍රමවේද දෙකම අනුගමනය කළ හැකි බැව් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කරුණු පෙන්වා දෙන ලදී ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල බලධාරීන්ට කාරක සභාව නිර්දේශ කිරීම සිදුවිය.

තවද,විදේස් සංචාරකයන් සඳහා වෙනත් රටවල් භාවිතා කරන නූතන ගෙවීම් ක්‍රම පිළිබඳව වාර්තාවක් සකස් කර එය කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කළ නිලධාරීන්ට කාරක සභාව විසින් නියම කරන ලදී.

තවද, 2030 වසර වන විට සංචාරකයන් මිලියන 5ක පමණ පිරිසක් මෙරටට සංචාරය සඳහා පැමිණෙතැයි අපේක්ෂා කරන බැව් මෙහිදී අනාවරණය විය.
එබැවින් එලෙස පැමිණෙන සංචාරකයන් සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධන කිරීම පිණිස අදාල බලධාරීන් සමඟ සාකච්ඡා කොට සුදුසු යාන්ත්‍රණයක් සකස් කරන ලෙස කාරක සභාව අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.



# මෙරට පෞද්ගලික ආදායම් බදු ලිපිගොනු ලක්ෂ 05න් බදු ගෙවන්නේ 31,000ක් පමණයි - ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති මහින්දානන්ද අලුත්ගමගේ මහතා



■ දේශීය ආදායම් බදු පනත සංශෝධනය කිරීමට සහ බදු අභියාචනා කොමිෂන් සභාව අහෝසි කිරීමට සාකච්ඡා

■ බදු අදායම් ලැබීම නියාමනය කිරීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට යෝජනා

මෙර මෙරට පෞද්ගලික ආදායම් බදු ලිපිගොනු ලක්ෂ 05ක් පැවතියද එයින් බදු ගෙවනු ලබන්නේ 31,000ක් පමණක් බව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.මෙරට සීමිත සමාගම් 105,000ක් ලියාපදිංචි වී ඇති නමුත් එම සමාගම්වල බදු ආදායමෙන් 82%ක් ලැබෙනුයේ සමාගම් 382කින් බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ණය ලබා දීමේදී සැපිරිය යුතු කරුණු වන රටේ උද්ධමනය,රටේ සංචිත ප්‍රමාණය සහ රාජ්‍ය ආදායම පිළිබඳ දෙවන සමාලෝචනය කිරීම් සිදු කරන දෙසැම්බර් මාසය වන විට ප්‍රශස්ත තත්ත්වයක පවත්වා ගැනීම වැදගත් වන බවත් සභාපතිවරයා මෙහිදී අවධාරණය කළේය.ඒ නිසා රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ දේශිය ආදායම් දෙපාර්තමේන්තුව යන ආයතන සමග සිය කමිටුව නිරන්තර සාකච්ඡා පවත්වමින් රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට කටයතු කරන බවද සභාපතිවරයා පැවසීය.

ඒ මහතා මේ කරුණු සඳහන් කළේ ජාතික ආර්ථික හා භෞතික සැළසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පාර්ලිමේන්තුවේදී මේ මස 06 වැනිදා රැස්වූ අවස්ථාවේදීය.

උක්ත බදු අදායම් ඒකරාශී කර ගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අපොහොසත් වීම පිළිබඳ දීර්ඝ වශයෙන් කරුණු දැක්වූ සභාපතිවරයා මෙම බදු ආදායම් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට පියවර ගන්නා ලෙසත් කාරක සභාව ලෙස ඒ සම්බන්ධව සාධනීය මැදිත්වීම් සිදුකරමින් පවතින බවද සඳහන් කළේය.



මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයවීමට ඇති හිඟ බදු මුදල වන රුපියල් බිලියන 904ක මුදල අයකර ගැනීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා විය.බදු ආදායම් අයකර ගැනීම ක්‍රමවත් කිරීම සඳහා දේශීය ආදායම් බදු පනත සංශෝධනය කිරීමටත්,බදු අභියාචනා කොමිෂන් සභාව අහෝසි කිරීම පිළිබඳවත් අධිකරණ අමාත්‍යතුමා සමග සාකච්ඡා සිදු කරමින් පවතින බවද සභාපතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය.එයට අමතරව දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ද සිය සහය උපරිමයෙන් ලබා දෙන බවද අලුත්ගමගේ මහතා පැවසීය.



මෙහිදී අදහස් දැක්වූ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සඳහන් කළේ සිය දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ලැබෙන සහයෝගය අගය කළේය.2023 වර්ෂය සඳහා රජය විසින් ලබා දී ඇති බදු ආදායම් ඉලක්කය වන රුපියල් ට්‍රිලියන 1.6 ක මුදල මුල් මාස 6 තුළ 40% ක් ලෙස සහ ඉතිරි මාස 6තුළ 60%ක් වශයෙන් ඉපයීමට අපේක්ෂිත වූ බවත් මුල් මාස 6ට අදාළ ඉලක්කය මේ වන විට සපුරා ඇති බවත් කොමසාරිස්වරයා සඳහන් කළේය. එයට අමතරව ඉතිරි මාස 6 දී අපේක්ෂිත බදු ආදායම් උපයා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවද ඒ මහතා පැවසිය.



මෙහිදී සභාපතිවරයා සඳහන් කළේ බදු අදායම් ලැබීම නියාමනය කිරීම සඳහා ක්‍රමවත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අවශ්‍ය බවයි. මෙහිදි සාමාජික මන්ත්‍රීවරු මෙන්ම නිලධාරීන්ද පෙන්වා දුන්නේ මෙරට සමාගම් ලියාපදිංචි කිරීම සඳහා ලබා දෙන දත්ත සත්‍ය ඒවා නොවීම හේතුවෙන් බදු අය කරගැනීමේදී ගැටළුවලට මුහුණ පෑමට සිදු වන බවයි.



එමෙන්ම ශ්‍රී ලංකා රේගු දෙපාර්ගමේන්තුව,සුරාබදු දෙපාර්තමේන්තුව සහ දේශිය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ කරමින් ඩිජිටල් දත්ත පද්ධතියක් ඉතා ඉක්මනින් සකසා ගැනීමේ අවශ්‍යතාවය මෙන්ම මෙරට පෞද්ගලික බදු ලිපිගොනු නැවත ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවයද කමිටුවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.



# ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීම සඳහා නව යෙදුමක් වහාම සකස් කරන ලෙස ක්‍රම හා විධි කාරක සභාවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස්



ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් සහිත මත්පැන් බෝතල් හඳුනාගැනීම සඳහා නව යෙදුමක් වහාම සකස් කරන ලෙස ක්‍රම සහ විධි කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලදී.

මේ මස 24 වැනිදා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් ඒ මහතා මෙම උපදෙස් ලබාදුන්නේය.පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා සහ ගරු ගාමිණී වලේබොඩ යන මහත්වරුන් ද මෙම අවස්ථාවට එක්විය.

ව්‍යාජ නිෂ්පාදන වැළැක්වීම සඳහා මත්පැන් බෝතල් සඳහා ආරක්ෂක ස්ටිකර් හඳුන්වා දී ඇතත් තවමත් ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් වෙළෙඳ පොළේ භාවිත වන බවත් මෙහිදී කාරක සභාවේ සභාපතිවරයා පෙන්වා දුන්නේය. එසේම ව්‍යාජ ස්ටිකර් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් දෙපාර්තමේන්තුව සතුව නොමැති බවත් මෙහිදී අනාවරණ විය.

තවද පසුගිය අයවැයෙන් බදු වැඩිකිරීම් ඇතුළු කරුණු කිහිපයක් මත්පැන් ආදායම පහළ වැටීමට හේතු වූ බව මෙහිදී දෙපාර්තමේන්තුවේ නිලධාරීහු පෙන්වා දුන් අතර මිල වැඩි කිරීමට පෙර ඉල්ලුම් නම්‍යතාවය ගණනය කිරීම අවශ්‍ය බව මෙහිදී කාරක සභාවේ සාමාජිකයින් පෙන්වා දුන්නේය. එසේම මත්පැන් සඳහා බදු වැඩිකිරීම සිදුකිරීමේදී දෙපාර්තමේන්තුව විසින් සුදුසු සමීක්ෂණ සිදු කොට මුදල් අමාත්‍යාංශයට නිසි උපදෙස් ලබාදිය යුතු බවද කාරක සභාවේ අවධාරණය කළේය. එමෙන්ම මත්පැන් නිෂ්පාදනය සඳහා භාවිත කරන සහල් ඇතුළු අමුද්‍රව්‍ය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ලබාදෙන ලෙස ද කාරක සභාව සුරාබදු දෙපාර්තමේන්තු වේ නිලධාරීන් වෙත නියෝග කළේය.

තවද රට තුළ නිෂ්පාදනය වන මත්පැන් ප්‍රමාණය සහ වෙළෙඳ පොළට නිකුත් කෙරෙන මත්පැන් ප්‍රමාණය ඇතුළු තොරතුරු සෘජුව පරීක්ෂා කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ යාන්ත්‍රණයක් තිබිය යුතු බව ද කමිටුව පෙන්වා දෙන ලදී.

මධ්‍යසාර නිෂ්පාදනය සඳහා රා අවශ්‍යතාවය සහ කෘත්‍රිම රා නිෂ්පාදනයෙන් සිදුවන බලපෑම් සහ රා නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා නව පොල් ගස් වගා කිරීම ඇතුළු විවිධ කරුණු පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

එසේම බොහෝ මත්පැන් සමාගම්වලින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ බදු මුදල් පවතින බවද නිලධාරීහු මෙහිදී පැවසූ අතර එවැනි සමාගම්වල බලපත්‍ර අවලංගු කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස මෙහිදී කාරක සභාවේ සභාපතිවරයා පෙන්වාදුන්නේය.



# බදු එකතු කිරීමේ ක්‍රියාවලියේ ගැටලු සොයා බැලීමට පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක

■බදු එකතු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම සහ සහයෝගය ලබා දීමට කාරක සභාව සූදානම් - සභාපති පාඨලී චම්පික රණවක මහතා



බදු එකතු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම සහ සහයෝගය ලබා දීමට සිය කාරක සභාව සූදානම් බව ක්‍රම සහ විධි කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා පැවසීය.

මේ අනුව ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සම්පාදනය සඳහා පියවර ගන්නා ලෙස ද ආදායම් බදු කොමසාරිස් ජනරාල් ඩී.ආර්.එස්. හපුආරච්චි මහතාට කාරක සභා සභාපතිවරයා දැනුම් දුන්නේය.

මේ මස 13 වැනිදා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින් ක්‍රම සහ විධි කාරක සභාවේ සභාපතිවරයා මේ බව පැවසීය. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාද මෙම අවස්ථාවට එක්විය.

රජයට ආදායම් ලබා දෙන ප්‍රධානතම ආයතනයක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවතින දුර්වලතා හඳුනාගනිමින් රාජ්‍ය බදු ආදායම ඉහළ නැංවීමට සහ බදු ගෙවන්නන්ට කාර්යක්ෂම සේවාවක් ලබා දීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් මෙම සංචාරය සංවිධානය වී තිබිණි.

ආදායම් බදු එකතු කිරීම සඳහා දැනට භාවිතා කරන RAMI පද්ධතිය සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමසා සිටි කාරක සභා සභාපතිවරයා පවසා සිටියේ මෙම පද්ධතියේ යාවත්කාලීන වීම් සමග කාර්ය මණ්ඩලයටද නිසි පුහුණුවක් ලබා දීම අත්‍යවශ්‍ය බවයි.එසේම බැංකු පද්ධතිය, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය යන ආයතන සමඟ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කඩිනමින් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාව මෙහිදී දැඩිව අවධාරණය කරන ලදී.

වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයන් සඳහා බදු ලිපිගොනු විවෘත කිරීමට අදාළ දත්ත පද්ධතියක් නිසි පරිදි පවත්වාගෙන යාමේ අවශ්‍යතාව ද මෙහිදී සාකච්ඡා විය. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී සිදු කිරීමට නියමිත සංගණනය සමග සම්බන්ධ වී අදාළ තොරතුරු රැස්කොට නිසි දත්ත පද්ධතියක් සැකසීමට පියවර ගන්නා ලෙස ද කාරක සභා සභාපතිවරයා උපදෙස් දුන්නේය.

මීට අදාළ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් මෙරටින්ම සපයා ගත හැකි බව පෙන්වා දුන් කාරක සභාව රාජ්‍ය පුද්ගලික හවුල්කාරීත්වය යටතේ හෝ මෙවැනි නිවැරදි දත්ත පද්ධතියක් සහිත ක්‍රමවේදයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙන ලදී. එසේම බදු ගෙවන්නන්ට ලිපි යැවීම වැනි සාම්ප්‍රදායික ක්‍රමවේදයන් වෙනුවට ජංගම දුරකථනයට කෙටි පනිවුඩයක් මගින් දැනුම්දීම, ජංගම දුරකථන යෙදවුම් (Mobile App) හඳුන්වා දීම වැනි නවීන ක්‍රමවේදයන්ට අනුගතවීමේ අවශ්‍යතාව අවධාරණය කරන ලදී.

එසේම ස්ථාවර බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වීම, සිදුවිය යුතු අදාළ නෛතික වෙනස්කම් ඇතුළු පවතින බාධා පිළිබඳව වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙසද උපදෙස් ලබා දීම සිදුවිය.

තවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සකස් කිරීම සඳහා ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව සම්බන්ධ කරගනිමින් වැඩමුළුවක් ද සංවිධානය කරන ලෙස කාරක සභා සභාපතිවරයා මෙහිදී නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

රජයේ ආදායම වැඩිකිරීම ඇතුළු සාධනීය පියවරයන් නිර්දේශ කිරීම සඳහා වන ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව අදාළ ආයතන පරිශ්‍රයන් වෙත ගොස් විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම විමර්ශනය සිදුවිය.

පාර්ලිමේන්තු
ජායා ගැලරිය























මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

## ජූලි

**ජූලි 1 සෙනසුරාදා**

● ජූලි 04 අඟහරුවාදා දක්වා කල්තබන ලද පාර්ලිමේන්තුව ස්ථාවර නියෝග 16 විධිවිධාන ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයා විසින් කථානායකවරයාගෙන් ඉල්ලුම් කරනු ලැබීම අනුව පාර්ලිමේන්තුව කැඳවීම

● 2023 ජූනි 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ජනරජයේ දේශීය ණය තිරසරභාවය තහවුරු කිරීමටත් ශ්‍රී ලංකාවේ මහජනතාව සහ අනාගත පරපුර ප්‍රතිලාභ ලබන තිරසර ආර්ථික වර්ධනය පෙරදැරි කරගත් ආර්ථික ප්‍රකෘතිමත්භාවය වෙත වන වේගවත් සංක්‍රමණය තහවුරු කිරීම සඳහාත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දේශීය ණය ප්‍රශස්තකරණය සඳහා අවශ්‍ය සියලුම අවසර මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට ලබාදීමට අදාළ යෝජනා සම්මතය පක්ෂව ඡන්ද 122ක්ද, විපක්ෂව ඡන්ද 62ක්ද වශයෙන් බෙදී පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සංශෝධිතාකාරයෙන් සම්මත කරනු ලැබීම

**ජූලි 5 බදාදා**

● 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ "ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)"

● 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ "ආයුර්වේද (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් ද්විත්වය පාර්ලිමේන්තුවට පිළිගැන්වීම

● පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත කැටගොඩ මහතා විසින් මතු සඳහන් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ත්‍රිත්වය ඉදිරිපත් කිරීම සඳහා අවසරය ලබාගැනීම

(අ) "1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම

(ආ) "(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සහ

(ඇ) "(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

**ජූලි 6 බ්‍රහස්පතින්දා**

"දූෂණ විරෝධී" සහ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත් ද්විත්වය විවාද කර දෙවැනි වර කියවීම පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීමෙන් අනතුරුව පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාව 2023 ජූලි 19 අඟහරුවාදා තෙක් කල්තැබීම

ජූලි 7 සිකුරාදා

● 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ "ආයුර්වේද (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සමක් පිටපතක් කථානායකවරයාට ලැබුණු බව නිවේදනය කිරීම

● 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත විවාද කර දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධන රහිතව පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කිරීම

● ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ර්පණ පනතේ 2 වගන්තිය යටතේ නාමෝද්දිෂ්ට පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදන ලදුව,2023 පෙබරවාරි 14 දිනැති අංක 2319/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය අනුමත කිරීම

ජූලි 14 සිකුරාදා

ගුවන් ප්‍රවාහන සංශෝධන පනත් කෙටුම්පත 2023 අංක 8 දරන පනත වශයෙන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව සහතිකය සටහන් කිරීම

ජූලි 18 අඟහරුවාදා

● 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ "ආයුර්වේද (සංශෝධන)", "1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම";
"(255 වන අධිකාරය වූ) නගර සහා ආඥාපනත සංශෝධනය කිරීම"; සහ
"(252 වන අධිකාරය වූ) මහ නගර සහා ආඥාපනත සංශෝධනය කිරීම"
නමැති පනත් කෙටුම්පත් හතර අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් කථානායකවරයාට ලැබුණු බව නිවේදනය කිරීම

● "අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම" නමැති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම

● පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත සංශෝධනය කිරීම සඳහා පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම

● රේගු ආඥා පනත (235 අධිකාරය) යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් යෝජනා සම්මතය අනුමත කිරීම

● ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි," 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූනි 09 දිනැති අංක 2335/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලද රෙගුලාසි අනුමත කිරීම

● පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවීමේ සිද්ධි සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කරුණු විමර්ශනය කර ඒ සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව සම්මත කිරීම

ජූලි 19 බදාදා

● 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ "ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් කථානායකවරයාට ලැබුණු බව නිවේදනය කිරීම

● "දූෂණ විරෝධී" සහ "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත් ද්විත්වය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේදී සලකා බලා තුන්වැනි වර කියවා සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම

● හදට හද භාරකාර අරමුදල (සංස්ථාගත කිරීමේ) නමැති පනත් කෙටුම්පත දෙවැනිවර කියවා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම

ජූලි 20 බ්‍රහස්පතින්දා

● 2022 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා "විසර්ජන (සංශෝධන)" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම

● ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධිතාකාරයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම

● 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව 2023 ජූලි 17 දිනැති අංක 2341/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ජනාධිපතිවරයා විසින් පළ කරන ලද ප්‍රකාශනය අනුමත කිරීම

ජූලි 21 සිකුරාදා

● 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා වූ "ආයුර්වේද (සංශෝධන)",
"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම";
"(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම"; සහ
"(252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම"
නමැති පනත් කෙටුම්පත් හතර අභියෝගයට ලක් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම්වල පිටපත් කථානායකවරයාට ලැබුණු බව නිවේදනය කිරීම

● බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා සංශෝධිතාකාරයෙන්
පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම


# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 37 වැනි කාණ්ඩය I ජූලි 2023

ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka @ParliamentLK

@slparliament Parliament of Sri Lanka